# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**11 ශ්‍රේණිය**

## ගෘහ ආර්ථික විද්‍යාව - II

නම/ විභාග අංකයඃ ..........................................

- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමිවන අතර අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමිවේ.**

01) සකුන්තලා දිසානායක වෘත්තියෙන් ලිපිකාරිණියකි. ඇයගේ සැමියා බැංකුවක සේවය කරන අතර ඇයට මුල් ළමාවියේ පසුවන දියණියක හා මාස 4ක ළදරුවෙකු ද සිටියි. ආසන්න නිවසක ජීවත් වන මව නිතරම දරුවන් පිළිබඳ සොයා බලයි. සකුන්තලාගේ නිවස වටා එළවළු, පලතුරු වගා කර ඇත. දෙදෙනාම රැකියාවල නියුතු බැවින් සති අන්තයෙහි නිවස පිරිසිදු කිරීමට සහ ගෙවත්තේ වගා කටයුතු වල නිරතවීමට කාලය වෙන්කර ගනියි.

i. පවුල සඳහා ආහාර සකස් කිරීමේ දී මව විසින් සැලකිල්ලට ගන්නා කරුණු දෙකක් සඳහන් කරන්න.

ii. මුල් ළමාවියේ පසුවන දියණියගේ විශේෂ පෝෂණ අවශ්‍යතා දෙකක් සඳහන් කරන්න.

iii. රැකියාවට යන සැමියාට රැගෙන යාමට දිවා ආහාර වේලක් සකස් කිරීමේ දී අවධානය යොමුකළ යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.

iv. දියණියගේ උපන් දිනය සඳහා දියාරු පිටි මෝලිය ආශ්‍රයෙන් සෑදිය හැකි ආහාර වර්ග දෙකක් සඳහන් කරන්න.

v. මාස 4ක් වයසැති දරුවාගේ ඇඳුම් සඳහා සුදුසු රෙදි වර්ග දෙකක් නම් කරන්න.

vi. ඇඳුම් මැසීමට අවශ්‍ය ද්‍රව්‍ය දෙකක් හා මෙවලම් දෙකක් නම් කරන්න.

vii. ඩිම්බ කෝෂ මගින් සිදුකෙරෙන කාර්යයන් දෙකක් ලියන්න.

viii. ගර්භණී මව විසින් අනුගමනය කළ යුතු සෞඛ්‍ය පිළිවෙත් දෙකක් ලියන්න.

ix. පවුල සතු මානව සම්පත් දෙකක් ලියන්න.

x. ඔවුන්ගේ ඉඩමේ මායිම් සඳහා යොදා ගත හැකි ක්‍රම හතරක් සඳහන් කරන්න.

(ලකුණු 2x10=20)

02)

i. රෙදි පිරියම් කිරීම යනුවෙන් කුමක් අදහස් වේද? (ල 3)

ii. රෙදි භාවිත කර උපාංග නිර්මාණය කිරීමට සැලසුම් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් ලියන්න. (ල 3)

iii. ළදරු ඇඳුම් සඳහා රෙදි තෝරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් ලියන්න. (ල 4)

03)

i. විටමින් A සත්ව ආහාරවල හා ශාක ආහාරවල අඩංගු වන්නේ කෙසේද? උදාහරණය බැගින් දක්වන්න. (ල 3)

ii. කාබෝහයිඩ්‍රේට්වල කෘත්‍යයන් පැහැදිලි කරන්න. (ල 3)

iii. ගර්භණී මවකට සුදුසු බොජුන් පතක් සැලසුම් කරන්න. (ල 4)

04)

i. ආහාර තෝරා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් දක්වන්න. (ල 3)

ii. කැල්සියම් ඌණතාව නිසා ඇති වන අස්ථි විකෘති රෝගයේ රෝග ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ල 3)

iii.

a) ආහාර නරක්වීම යනු කුමක්ද?

b) ආහාර නරක්වීමට බලපාන භෞතික හේතු හතරක් සඳහන් කරන්න. (ල 4)

05)

i. නිවසක් ඉදිකිරීමේදී අවට පරිසරය කෙබඳු විය යුතුද? (ල 3)

ii. රාශිකරණය යනු කුමක්ද? උදහරණ දෙකක් දක්වන්න. (ල 3)

iii.

a) ස්වභාවික ආලෝකය සහ වාතාශ්‍රය ලබා ගැනීම සඳහා යොදා ගත හැකි අනුයෝගී ක්‍රම දෙකක් ලියන්න.

b) නිවස තුළට ස්වභාවික ආලෝකය සහ වාතාශ්‍රය මැනවින් ලබා ගැනීමෙන් ඇති වාසි දෙකක් සඳහන් කරන්න. (ල 4)

06)

i. ස්ත්‍රීලිංගික හා පුරුෂ ලිංගික හෝමෝන දක්වන්න. (ල 3)

ii. ද්විතීයික ලිංගික ලක්ෂණ තුනක් ස්ත්‍රී පුරුෂ භාවය අනුව සඳහන් කරන්න. (ල 3)

iii. නව යෞවන අවධියේ මානසික වර්ධනය බාහිරව පෙන්නුම් කරන ලක්ෂණ හතරක් දක්වන්න. (ල 4)

07)

i. ගර්භණී භාවයේ ලක්ෂණ තුනක් දක්වන්න. (ල 3)

ii. ගර්භණී අවධියේ දී යකඩ අවශ්‍යතාවය වැඩිය. එසේ වීමට හේතු සඳහන් කරන්න. (ල 3)

iii. ස්ත්‍රී ප්‍රජනක පද්ධතියේ පැහැදිලි රූප සටහනක් ඇඳ නම් කරන්න. (ල 4)